# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,509 - 2026 ඔක්තෝබර් මස 02 සිකුරාදා - 2026.10.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමන් විසින් කරන ලද ප්‍රකාශය ආදිය ... ... | — | රජයේ නිවේදන ... ... ... ... ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | මිල පාලන දැන්වීම් ... ... ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... | — | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... ... ... | 1860 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — | නැවියන්ට දැන්වීම් ... ... ... ... ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... ... ... | — |


*සැ.යු.*: (i) ආගමන පනත් කෙටුම්පත 2026.09.25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) විදේශීය ත්‍රස්තවාදී සටන්කරුවන් වැළැක්වීමේ පනත් කෙටුම්පත 2026.09.25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) ශ්‍රී ලංකා ක්‍රිකට් පනත් කෙටුම්පත 2026.09.25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ඔක්තෝබර් මස 23 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ඔක්තෝබර් මස 09 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1859 - B 082835 - (2026/10)

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - කඩවත ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 3642709, 3666340, 3674831, 3677770, 3678959, 3680776, 3682081 සහ 3684878

"ජයාස් ට්‍රේඩිං කන්සර්න්" හි මහමලගේ තිලක් ජයතු ප්‍රනාන්දු සහ කුරනගේ මේරි කාංචනා තනුජා පෙරේරා

2026 මාර්තු මස 26 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. ජේ. එන්. ගුණවර්ධන විසින් 2023 සැප්තැම්බර් මස 15 වැනි දින සහතික කරන ලද අංක 1555 සහ 2023 නොවැම්බර් මස 10 වැනි දින සහතික කරන ලද අංක 1636 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති කොළඹ - 11, වයිනා වීදියේ, අංක 15 දරන ස්ථානයේ "ජයාස් ට්‍රේඩිං කන්සර්න්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යන ජා ඇල, දැලතුර, අංක 347/B දරන ස්ථානයේ මහමලගේ තිලක් ජයතු ප්‍රනාන්දු සහ කුරනගේ මේරි කාංචනා තනුජා පෙරේරා ණයකරුවන් හැටියට වෙනත් කරුණු අතර, ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද සහ ඉහත කී උකස් බැඳුම්කරයන් යටතේ නිසි ලෙස ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම එකී මහමලගේ තිලක් ජයතු ප්‍රනාන්දු සහ කුරනගේ මේරි කාංචනා තනුජා පෙරේරා පැහැර හැර ඇති හෙයින්,

සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. ගුණරත්න විසින් 2024 අගෝස්තු මස 22 වැනි දින සහතික කරන ලද අංක 5323 දරන උකස් බැඳුම්කරයක් මගින් මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති එකී "ජයාස් ට්‍රේඩිං කන්සර්න්" හි මහමලගේ තිලක් ජයතු ප්‍රනාන්දු සහ කුරනගේ මේරි කාංචනා තනුජා පෙරේරා ණයකරුවන් හැටියට වෙනත් කරුණු අතර, ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද සහ එකී උකස් බැඳුම්කරය යටතේ නිසි ලෙස ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම එකී මහමලගේ තිලක් ජයතු ප්‍රනාන්දු සහ කුරනගේ මේරි කාංචනා තනුජා පෙරේරා පැහැර හැර ඇති හෙයින්,

සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. ගුණරත්න විසින් 2024 අගෝස්තු මස 22 වැනි දින සහතික කරන ලද අංක 5322 දරන උකස් බැඳුම්කරයක් මගින් මෙහි පහත තුන්වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති එකී "ජයාස් ට්‍රේඩිං කන්සර්න්" හි මහමලගේ තිලක් ජයතු ප්‍රනාන්දු සහ කුරනගේ මේරි කාංචනා තනුජා පෙරේරා ණයකරුවන් හැටියට වෙනත් කරුණු අතර, ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද සහ එකී උකස් බැඳුම්කරය යටතේ නිසි ලෙස ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම එකී මහමලගේ තිලක් ජයතු ප්‍රනාන්දු සහ කුරනගේ මේරි කාංචනා තනුජා පෙරේරා පැහැර හැර ඇති හෙයින්,

සහ වෙනත් කරුණු අතර, මෙහි පහත පෙන්වන පරිදි, ඉහත කී උකස් බැඳුම්කරන් මත කාලීන ණය අංක 3642709 සහ කෙටි කාලීන ණය අංක 3666340, 3674831, 3677770, 3678959, 3680776 සහ 3682081 සම්බන්ධයෙන් ගෙවිය යුතු මුල් මුදල සහ පොළිය සහ කෙටි කාලීන ණය අංක 3684878 සම්බන්ධයෙන් ගෙවිය යුතු මුල් මුදලේ කොටස වශයෙන් රුපියල් මිලියන එකසිය තිස් අටයි දහ අට දහස් පන්සිය තුනයි ශත එක (රු. 138,018,503.01)ක මුදල 2026 පෙබරවාරි මස 19 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන එකසිය තිස් අටයි දහ අට දහස් පන්සිය තුනයි ශත එක (රු. 138,018,503.01) ක මුදල අයකර ගැනීම සඳහා මෙහි පහත විස්තර කරන ලද පරිදි වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට ඉහත කී උකස් බැඳුම්කර අංක 1555, 1636, 5323 සහ 5322 යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද පිළිවෙලින් මෙහි පහත පළමුවන, දෙවන සහ තුන්වන උපලේඛනයන්හි සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම සහ පරිශ්‍රය මහරගම, කටුවාවල පාරේ, අංක 30/83 දරන ස්ථානයේ සහ එසේම කොළඹ 08, බොරැල්ල, සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්, 1 වන මහල, 7/1/10 දරන ස්ථානයේ "ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්" යන නාමය, විලාසය යන ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන, බලයලත් වෙන්දේසිකරුවන් වන, ලොකු බණ්ඩා සේනානායක, මගුරුදෙනියේ වලව්වේ ත්‍රිවංක වරිත් සේනානායක, ගුරුගේ සුමනාවතී සේනානායක සහ ධනපාල මුදියන්සේලාගේ කාලිංග නවරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

(a) කාලීන ණය අංක 3642709 සඳහා රු. 29,078,337.46ක මුළු මුදලක් (2026 පෙබරවාරි මස 19 වැනි දින දක්වා මුල්

මුදල සහ පොළිය) සහ 2026 පෙබරවාරි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 26,250,000.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 10.88% බැගින් වැඩිදුර පොළිය සමගින්;

(b) කාලීන ණය අංක 3666340 සඳහා රු. 11,935,087.04ක මුළු මුදලක් (2026 පෙබරවාරි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2026 පෙබරවාරි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 10,262,000.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 12.88% බැගින් වැඩිදුර පොළිය සමගින්;

(c) කාලීන ණය අංක 3674831 සඳහා රු. 22,342,273.87 ක මුළු මුදලක් (2026 පෙබරවාරි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2026 පෙබරවාරි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 20,000,000.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 12.88% බැගින් වැඩිදුර පොළිය සමගින්;

(d) කාලීන ණය අංක 3677770 සඳහා රු. 22,310,646.46 ක මුළු මුදලක් (2026 පෙබරවාරි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2026 පෙබරවාරි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 20,000,000.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 12.88% බැගින් වැඩිදුර පොළිය සමගින්;

(e) කාලීන ණය අංක 3678959 සඳහා රු. 13,504,078.97 ක මුළු මුදලක් (2026 පෙබරවාරි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2026 පෙබරවාරි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,000,000.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 12.88% බැගින් වැඩිදුර පොළිය සමගින්;

(f) කාලීන ණය අංක 3680776 සඳහා රු.13,376,898.70 ක මුළු මුදලක් (2026 පෙබරවාරි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2026 පෙබරවාරි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,000,000.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 12.88% බැගින් වැඩිදුර පොළිය සමගින්;

(g) කාලීන ණය අංක 3682081 සඳහා රු. 19,483,180.51 ක මුළු මුදලක් (2026 පෙබරවාරි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2026 පෙබරවාරි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 17,500,000.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 12.88% බැගින් වැඩිදුර පොළිය සමගින්;

(h) කාලීන ණය අංක 3684878 සඳහා රු. 5,988,000.00 ක මුදලක් (2026 පෙබරවාරි මස 19 වැනි දින වන විට රු. 10,000,000.00 ක ගෙවිය යුතු මුල් මුදලේ කොටසක්) සහ 2026 පෙබරවාරි මස 20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,988,000.00ක එකී මුදල මත වර්ෂයකට 12.88% බැගින් වැඩිදුර පොළිය සමගින් වේ;

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා ඇල ප්‍රාදේශීය සභා සීමා සහ ජා ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුඩැල්ල දකුණ 192A ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත තුඩැල්ල ගමේ පිහිටි "වැටකෙයියාගහකුඹුර සහ මුතුරාජවෙල වැටකෙයියාගහකුඹුර හි කොටස" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් 2009.11.12 වැනි දින පිළියෙල කරන ලද අංක 10130 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : ප්‍රධාන පාර මගින් ද; නැගෙනහිරට : උපාලි ද සිල්වා උරුමක්කරුවන්ගේ ඉඩම සහ අංක 3311 දරන පිඹුරේ ලොට් 1A1 මගින් ද; දකුණට: හීන් ඇල මගින් ද සහ බස්නාහිරට : සෙබෙස්තියන් පෙරේරා මාවත මගින් ද මායිම් වූ එකී අංක 10130 දරන පිඹුර ප්‍රකාරව රූඩ් දෙකයි පර්චස් තිස් එකයි දශම නවය (අ.0, රූ.2, පර්.31.9) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව J 812/84 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමා සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 164, ඇලෙන් එගොඩ පමුණුගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත, ඇලෙන් එගොඩ පමුණුගම ගමේ පිහිටි "කොට්ටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. පී. ඒ. ශාන්ත ප්‍රිය පෙරේරා විසින් 2021.01.25 වැනි දින පිළියෙල කරන ලද අංක 5617 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට: අඩි පාර (ab), ජේ. ඒ. විජේවර්ධන සහ එම්. ජයසූරිය විසින් හිමිකම්ලත් ඉඩම, ඔරුවල පාර (ප්‍රාදේශීය සභා), මෙහි ලොට් 2 සහ පී. අල්පෝන්සෝ විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද; නැගෙනහිරට : අඩි පාර (ab), ඔරුවල පාර (ප්‍රාදේශීය සභා), මෙහි ලොට් 2 සහ පී. අල්පෝන්සෝ විසින් හිමිකම්ලත් ඉඩම සහ ක්‍රිස්ටි පෙරේරා විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද; දකුණට : අඩි පාර (ab), මෙහි ලොට් 2 ක්‍රිස්ටි පෙරේරා විසින් හිමිකම්ලත් ඉඩම සහ අඩි පාර මගින් ද සහ බස්නාහිරට : මෙහි ලොට් 2, අඩි පාර (ab) සහ මුහුදු වෙරළ මගින් ද මායිම් වූ එකී අංක 5617 දරන පිඹුර ප්‍රකාරව රූඩ් දෙකයි පර්චස් විසි නවයයි දශම පහ (අ.0, රූ.2, පර්.29.5)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය

ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව L 615/22 යටතේ ලියාපදිංචි කර ඇත.

**තුන්වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමා සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇලෙන් එගොඩ පුමුණුගම, අංක 164 ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත ඇලෙන් එගොඩ පමුණුගම ගමේ පිහිටි "මාදන්ගහවත්ත නැගෙනහිර සහ බටහිර කොටස" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, එල්. පී. ඒ. ශාන්ත ප්‍රිය පෙරේරා විසින් 2021.01.15 වැනි දින පිළියෙල කරන ලද අංක 5607 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට: එම්. එල්. ඩී. සී. නිරන්ජන් විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද; නැගෙනහිරට : එස්. ඒ. ජයමාන්න විසින් හිමිකම්ලත් ඉඩම සහ අඩි 10 පළල පාර මගින් ද; දකුණට : ඒ. ජයසූරිය විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද සහ බස්නාහිරට : ඔරුවල පාර (ප්‍රාදේශීය සභා) මගින් ද මායිම් වූ එකී අංක 5607 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි හයයි දශම හය (අ.0, රූ.0, පර්.26.6)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව L 615/21 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්.ඒ.පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2026 මාර්තු මස 26 වැනි දින.

10 - 389

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - වැල්ලවාය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 2509918 සහ 2746088
අලුත්කුගේ කුමාරසේන සහ දලුවත්තගේ අනුලාවති

2026 ජූලි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

වැල්ලවාය ප්‍රසිද්ධ නොතාරිස් එල්. කේ. ඒ. කුමාර විසින් 2015 ජූනි මස 17 වැනි දින සහතික කරන ලද අංක 1055 දරන උකස් බැඳුම්කරයක් මගින් මෙහි පහත පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය (සහ/හෝ මින්මතු සඳහන් කරන උකස් බැඳුම්කරයේ උපලේඛනය) උකස් කොට බැඳ දමා ඇති, වැල්ලවාය, කුමාරදාස මාවත හි අලුත්කුගේ කුමාරසේන සහ දලුවත්තගේ අනුලාවති යන දෙදෙනාම ණයකරුවන් හැටියට සහ එකී දලුවත්තගේ අනුලාවති උකස්කරු හැටියට ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද සහ එකී අංක 1055 දරන උකස් බැඳුම්කරය යටතේ නිසි ලෙස ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම එකී අලුත්කුගේ කුමාරසේන සහ දලුවත්තගේ අනුලාවති පැහැර හැර ඇති හෙයින්;

සහ වැල්ලවාය ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. එන්. ඩී. කුමාරි විසින් 2016 පෙබරවාරි මස 08 වැනි දින සහතික කරන ලද අංක 1066 සහ 2019 පෙබරවාරි මස 28 වැනි දින සහතික කරන ලද අංක 1451 දරන උකස් බැඳුම්කරයන් සහ වැල්ලවාය ප්‍රසිද්ධ නොතාරිස් එල්. කේ. ඒ. කුමාර විසින් 2022 ජනවාරි මස 05 වැනි දින සහතික කරන ලද අංක 3334 දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය (සහ/හෝ මින්මතු සඳහන් කරන උකස් බැඳුම්කරවල උපලේඛනය) උකස් කොට බැඳ දමා ඇති, එකී අලුත්කුගේ කුමාරසේන සහ දලුවත්තගේ අනුලාවති ණයකරුවන් හැටියට සහ එකී අලුත්කුගේ කුමාරසේන උකස්කරු හැටියට ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද සහ එකී උකස් බැඳුම්කරයන් යටතේ නිසි ලෙස ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම එකී අලුත්කුගේ කුමාරසේන සහ/හෝ දලුවත්තගේ අනුලාවති පැහැර හැර ඇති හෙයින්,

සහ වෙනත් කරුණු අතර, එකී උකස් බැඳුම්කරයන් මත ණය අංක 2509918 සහ 2746088 සම්බන්ධයෙන් රුපියල් මිලියන දහ නවයයි එක් ලක්ෂ තිස් හත් දහස් හයසිය අසූ තුනයි ශත හැට පහ (රු. 19,137,683.65)ක මුළු මුදලක් 2026 මැයි මස 25 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන දහ නවයයි එක් ලක්ෂ තිස් හත් දහස් හයසිය අසූ තුනයි ශත හැට පහ (රු. 19,137,683.65)ක මුදල අයකර ගැනීම සඳහා මෙහි පහත විස්තර කරන ලද පරිදි, වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට පිළිවෙළින් එකී උකස් බැඳුම්කර අංක 1055, 1066, 1451 සහ 3334 මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම සහ පරිශ්‍රය කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ අරච්චාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක්

ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

(a) ණය අංක 2509918 සඳහා රු. 8,111,710.34ක මුළු මුදලක් (2026 මැයි මස 25 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2026 මැයි මස 26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,775,970.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 16% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් සහ;

(b) ණය අංක 2746088 සඳහා රු. 11,025,973.31ක මුළු මුදලක් (2026 මැයි මස 25 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2026 මැයි මස 26 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 7,832,000.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 16% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් වේ.

### පළමුවන උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, වැල්ලවාය කෝරළේ, දිඹුලමුරේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නෙටොලගම ගමේ පිහිටි රාජ්‍ය ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : එච්. ඒ. ධර්මදාස විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද; නැගෙනහිරට : පාර සඳහා වෙන්කිරීම මගින් ද; දකුණට : ලීලා ගලප්පත්ති විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද සහ බස්නාහිරට : ඩබ්. එම්. පුංචි බණ්ඩා විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් දෙක (අ.0, රූ.2, පර්.0) ක විශාලත්වයෙන් වූ ඉඩම වේ.

ඉහත ඉඩම, බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් 2000 දෙසැම්බර් මස 5 වැනි දින පිළියෙල කරන ලද අංක 2746 දරන මැත මිනුම් අගයකට අනුව පහත පරිදි විස්තර කර ඇත.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, වැල්ලවාය කෝරළේ, දිඹුලමුරේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නෙටොලගම ගමේ පිහිටි බෙදා වෙන් කරන ලද ඉහත කී අංක 2746 දරන පිඹුරේ ලොට් අංක 01 වශයෙන් දැක්වෙන රාජ්‍ය ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : එච්. ඒ. ධර්මදාස විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද; නැගෙනහිරට : පාර සඳහා වෙන්කිරීම මගින් ද; දකුණට : ලීලී ගලප්පත්ති විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද සහ බස්නාහිරට: ඩබ්. එම්. පුංචි බණ්ඩා විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද මායිම් වූ එකී පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් දාහතර (අ.0, රූ.1, පර්.14)ක *හෙවත්* හෙක්ටෙයාර් බිංදුවයි දශම එකයි තුනයි හය (හෙක්ටෙයාර් 0.136)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

### කොන්දේසි

1. හිමිකරු විසින් මෙහි නිශ්චිතව දක්වා ඇති උප බෙදුම් ඒකකයකට වඩා අඩු ප්‍රමාණයකින් බෙදුණු කොටසක්, එනම්, පර්චස් 30ක වාරි ඉඩමක් බැහැර නොකළ යුතු ය.
2. හිමිකරු මෙහි දක්වා ඇති අවම කොටසට වඩා අඩුවෙන් නොබෙදුණු කොටසක්, එනම් 1/2, බැහැර නොකළ යුතු ය.
3. ඉහත 01 වන කොන්දේසියේ දක්වා ඇති උප බෙදුම් ඒකකයකට වඩා අඩු ප්‍රමාණයකින් යුතු හිමිකමේ නොබෙදුණු කොටසකට කිසිවෙකු හිමිකරුවෙකු නොවිය යුතු ය.
4. ඉහත කොන්දේසි 02හි නිශ්චිතව දක්වා ඇති අවම කොටසට වඩා අඩුවෙන් නොබෙදුණු කොටසකට කිසිවෙකු හිමිකරුවෙකු නොවිය යුතු ය.
5. දැනට ඉදිකරන ලද, ඉදිකිරීම් අතරතුර හෝ මින් පසු ඉදිකිරීමට නිශ්චිත කිසියම් වාරි කටයුත්තකින් රඳවා තබා ගැනීම හෝ එහි යම් කොටසක් ජලය සැපයිය හැකි නම් හිමිකරු එකී වාරිමාර්ග ප්‍රදේශය සම්බන්ධයෙන් වාරි මාර්ග ආඥාපනතේ විධි විධාන( පරිච්ඡේදය 453) සහ ඒ යටතේ සකස් කර ඇති ඕනෑම රීතියකට අනුකූල විය යුතු ය.
6. අයිතිකරු විසින් දිසාපතිවරයාගෙන් ලිඛිත අවසරයක් සහ සුදුසු අධිකාරියකින් බලපත්‍රයක් ලබාගෙන ඇත්නම් මිස, ඉඩමෙහි හෝ ඉඩමෙහි ඇති ඛනිජයක් කැණීම හෝ සෙවීම, ගැනීම, අත්පත් කර ගැනීම, විකිණීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම නොකළ යුතු ය.
7. ප්‍රාදේශීය ලේකම්වරයාගේ ලිඛිත පූර්ව අවසරය ඇතිව හැර හිමිකම හෝ එහි යම් කොටසක් බැහැර කිරීම නොකළ යුතු ය.

### දෙවන උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කෝරළේ, වැල්ලවාය ප්‍රාදේශීය සභා සීමා ඇතුළත, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලවාය අංක 151 ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත වැල්ලවාය රදාපොල ගමේ පිහිටි "රදාපොල කුඹුර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එම්. රූපසේන විසින් 2015.11.18 වැනි දින පිළියෙල කරන ලද අංක 1694 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට: ඇල (අත්හැර දමන ලද) සහ එම ඉඩමේ කොටස මගින් ද; නැගෙනහිරට: ඇල සහ බලයලත් මිනින්දෝරු එස්. එල්. ගලප්පත්ති විසින් පිළියෙල කරන ලද අංක 3632 දරන පිඹුරේ ලොට් 34 (අඩි 12 පළල පාර) මගින් ද; දකුණට : බලයලත් මිනින්දෝරු එස්. එල්. ගලප්පත්ති විසින් පිළියෙල කරන ලද අංක 3632 දරන පිඹුරේ ලොට් 18 මගින් ද සහ බස්නාහිරට : ඉසලෙබ්බේ විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද මායිම් වූ එකී අංක 1694 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්ස (අ.0, රූ.0, පර්.20)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය කෝරළේ, වැල්ලවාය ප්‍රාදේශීය සභා සීමා ඇතුළත, වැල්ලවාය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලවාය අංක 151 ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත වැල්ලවාය රදාපොල ගමේ පිහිටි "රදාපොල කුඹුර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එල්. ගලප්පත්ති විසින් 1989.06.28 වැනි දින පිළියෙල කරන ලද අංක 3632 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 17 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : ඇල සහ එම ඉඩමේ කොටස මගින් ද; නැගෙනහිරට : ඇල සහ ලොට් 34 (අඩි 12 පළල පාර) මගින් ද; දකුණට : ලොට් 18 මගින් ද සහ බස්නාහිරට : ඉසලෙබ්බේ විසින් හිමිකම්ලත් ඉඩම මගින් ද මායිම් වූ එකී අංක 3632 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්ස (අ.0, රූ.0, පර්.20)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

1989.06.28 වැනි දින එකී අංක 3632 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 31, 32, 33 සහ 34 මතින් මාර්ග අයිතිය සමග වේ.

ආර්.ඒ.පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2026 ජූලි මස 28 වැනි දින.

10 - 334

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - මොණරාගල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව් 116) අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 2747127
ජංගම ගිණුම් අංකය : 1120902001
ලියන ආරච්චිගේ ප්‍රදීප් කුමාර

2026 ජූලි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් 2011 සැප්තැම්බර් මස 07 වැනි දින සහතික කරන ලද අංක 18249, 2012 ජනවාරි මස 11 වැනි දින සහතික කරන ලද අංක 18687, 2015 නොවැම්බර් මස 06 වැනි දින සහතික කරන ලද අංක 21359, රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. ජේ. එන්. ගුණවර්ධන විසින් 2017 ජූලි මස 04 වැනි දින සහතික කරන ලද අංක 384 සහ රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. කේ. එල්. ඩබ්. අබේරත්න විසින් 2019 ජූලි මස 12 වැනි දින සහතික කරන ලද අංක 227 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති, මොණරාගල, කුඹුක්කන, මාදුරුකැටිය, ඔයිල් ෆාම්, යනුශ්වාස, අංක 12 දරන ස්ථානයේ ලියන ආරච්චිගේ ප්‍රදීප් කුමාර ණයකරු හැටියට ඉහත කී පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද සහ එකී උකස් බැඳුම්කරයන් යටතේ නිසි ලෙස ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම එකී ලියන ආරච්චිගේ ප්‍රදීප් කුමාර පැහැර හැර ඇති හෙයින්,

සහ එකී උකස් බැඳුම්කරයන් මත, මෙහි පහත පෙන්වන පරිදි, ණය අංක 2747127 සම්බන්ධයෙන් මුල් මුදල සහ පොළිය සහ අංක 1120902001 දරන ජංගම ගිණුම මත අයිරාව සම්බන්ධයෙන් ගෙවිය යුතු මුළු මුදලේ කොටස වශයෙන් රුපියල් මිලියන පහළොවයි තුන් ලක්‍ෂ තිස් නව දහස් හත්සිය දහයයි ශත පනස් නවය (රු. 15,339,710.59)ක මුදලක් 2026 ජුනි මස 15 වැනි දින දක්වා කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන පහළොවයි තුන් ලක්‍ෂ තිස් නව දහස් හත්සිය දහයයි ශත පනස් නවය (රු. 15,339,710.59)ක මුදල අයකර ගැනීම සඳහා මෙහි පහත විස්තර කරන ලද පරිදි,වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී උකස් බැඳුම්කර අංක 18249, 18687, 21359, 384 සහ 227 මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම සහ පරිශ්‍රය කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ අරච්චාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

(a) ණය අංක 2747127 සඳහා 2026 ජුනි මස 15 වැනි දිනට රු. 6,539,652.59ක මුදලක් සහ 2026 ජුනි මස 16 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,449,942.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 15% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් සහ

(b) අංක 1120902001 දරන ජංගම ගිණුම මත අයිරා පහසුකම සඳහා 2026 ජුනි මස 15 වැනි දිනට රු. 8,800,058.00ක කොටස් මුදලක් (රු. 9,040,661.01 න්) සහ 2026 ජුනි මස 16 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 8,800,058.00ක එකී මුදල මත වර්ෂයකට 29% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් වේ.

**උපලේඛනය**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල වැදිරට කෝරළේ, මොණරාගල ප්‍රාදේශීය සභා සීමා ඇතුළත මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මදුරුකැටිය - අංක 131B ග්‍රාම

නිලධාරි කොට්ඨාසය ඇතුළත මුප්පනේ ගමේ පිහිටි "කුමාරවත්ත" (ඔයිල් පාම් ඩිවිෂන්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. සී. පුෂ්පකුමාර විසින් 2011 මාර්තු මස 12 වැනි දින පිළියෙල කරන ලද අංක 5281 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට: මෙහි ලොට් 60 සහ 62 මගින් ද; නැගෙනහිරට : මෙහි ලොට් 65 සහ 64 මගින් ද; දකුණට : මෙහි ලොට් 64 සහ 92 මගින් ද සහ බස්නාහිරට : මෙහි ලොට් 58 සහ 60 මගින් ද මායිම් වූ එකී අංක 5281 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්ස (අ.0, රූ.0, පර්.20)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල වැදිරට කෝරළේ, මොණරාගල ප්‍රාදේශීය සභා සීමා ඇතුළත මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මදුරුකැටිය - අංක 131B ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත මුප්පනේ ගමේ පිහිටි "කුමාරවත්ත" (ඔයිල් පාම් ඩිවිෂන්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, එච්. කේ. මහින්ද විසින් 2002 පෙබරවාරි මස 18 වැනි දින පිළියෙල කරන ලද අංක 1303 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 63 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මෙහි ලොට් 60 සහ 62 මගින් ද; නැගෙනහිරට: මෙහි ලොට් 65 සහ 64 මගින් ද; දකුණට : මෙහි ලොට් 64 සහ 92 මගින් ද සහ බස්නාහිරට : මෙහි ලොට් 58 සහ 60 මගින් ද මායිම් වූ එකී අංක 1303 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්ස (අ.0, රූ.0, පර්. 20)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

එකී ඉඩමට වෙන්කරන ලද මාර්ග අයිතිය සමග වේ.

ආර්.ජී.පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2026 ජූලි මස 28 වැනි දින.

10 - 333

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - කිරිබත්ගොඩ ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 3752835
"ඔරිකොන් ස්පෙෂලිස්ට් වැනල් කන්සල්ටේෂන්" හි ඇතිගේ ඩෙස්මන්ඩ් ලිලන්ජිත් සිල්වා සහ තෙබුවන ආචාරිගේ ප්‍රමිලා ශිරානි තෙබුවන

2026 මැයි මස 27 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. ජේ. එන්. ගුණවර්ධන විසින් 2024 නොවැම්බර් මස 26 වැනි දින සහතික කරන ලද අංක 2143 සහ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. ජේ. එන්. ගුණවර්ධන විසින් 2020 ජූලි මස 22 වැනි දින සහතික කරන ලද අංක 657 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද දේපළ (සහ/හෝ මින්මතු සඳහන් කරන උකස් බැඳුම්කරයන්හි උපලේඛනයේ) උකස් කොට බැඳ දමා ඇති "ඔරිකොන් ස්පෙෂලිස්ට් වැනල් කන්සල්ටේෂන්" යන නාමය සහ විලාසය යටතේ හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යන දෙදෙනාම කඩවත, මහර, එක්සත් මාවතේ, අංක 141/3/1 දරන ස්ථානයේ ඇතිගේ ඩෙස්මන්ඩ් ලිලන්ජිත් සිල්වා සහ තෙබුවන ආචාරිගේ ප්‍රමිලා ශිරානි තෙබුවන ණයකරුවන් හැටියට සහ තෙබුවන ආචාරිගේ ප්‍රමිලා ශිරානි තෙබුවන උකස්කරු හැටියට වෙනත් කරුණු අතර, ඉහත කී පහසුකම නැවත ගෙවීම සඳහා ඇපය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද සහ එකී උකස් බැඳුම්කරයන් යටතේ නිසි ලෙස ඉල්ලා සිටියත් අයවිය යුතු මුදල් ගෙවීම් එකී ඇතිගේ ඩෙස්මන්ඩ් ලිලන්ජිත් සිල්වා සහ/හෝ තෙබුවන ආචාරිගේ ප්‍රමිලා ශිරානි තෙබුවන පැහැර හැර ඇති හෙයින්,

සහ ඉහත කී උකස් බැඳුම්කරයන් මත කාලීන ණය අංක 3752835 සම්බන්ධයෙන් මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් මිලියන විසි එකයි තුන් ලක්ෂ අනූ හය දහස් තුන්සිය අසූ හතයි ශත හැට පහ (රු. 21,396,387.65)ක මුළු මුදලක් 2026 මාර්තු මස 26 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්. සී. හට අයවිය යුතුව හා ලැබිය යුතුව තිබූ හෙයින් එකී රුපියල් මිලියන විසි එකයි තුන් ලක්ෂ අනූ හය දහස් තුන්සිය අසූ හතයි ශත හැට පහ (රු. 21,396,387.65)ක මුදල අයකර ගැනීම සඳහා සහ 2026 මාර්තු මස 27 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 18,999,995.00ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 11.5% බැගින් වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට ඉහත කී අංක 2143 දරන උකස් බැඳුම්කරය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ මහරගම, කටුවාවල පාරේ, අංක 30/83 දරන ස්ථානයේ සහ එසේම කොළඹ 08, බොරැල්ල, සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්, 1 වන මහල, අංක 7/1/10 දරන ස්ථානයේ "ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන, බලයලත් වෙන්දේසිකරුවන් වන, ලොකුබණ්ඩා සේනානායක, මගුරුදෙනියේ වලව්වේ ත්‍රිවංක චරිත් සේනානායක, ගුරුගේ සුමනාවතී සේනානායක සහ ධනපාල මුදියන්සේලාගේ කාලිංග නවරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය සභා සීමා තුළ සහ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලවතුහේන්පිට දකුණ - 267 ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත තලවතුහේන්පිට දකුණ ගමේ පිහිටි "ගල්දෙනියවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. ගාමිණී විතාන විසින් 2018.07.26 වැනි දින පිළියෙල කරන ලද අංක 928/2018 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1C/1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් : ඊසානට: එක්සත් මාවත මගින් ද; ගිණිකොණට : අංක 637/1998 දරන පිඹුරේ ලොට් 1D මගින් ද; නිරිතට : අංක 637/1998 දරන පිඹුරේ ලොට් 1E සහ ලොට් 1B (අඩි 10 පළල පාර) මගින් ද සහ වයඹට : ලොට් 1B (අඩි 10 පළල පාර) මගින් ද මායිම් වූ එකී අංක 928/2018 දරන පිඹුර ප්‍රකාරව පර්චස් අටයි දශම දෙකයි පහ (අ.0, රූ.0, පර්.8.25)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය සභා සීමා තුළ සහ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලවතුහේන්පිට දකුණ - 267 ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත තලවතුහේන්පිට දකුණ ගමේ පිහිටි "ගල්දෙනියවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් 1998.10.20 වැනි දින පිළියෙල කරන ලද අංක 637/1998 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1C වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් : ඊසානට : එක්සත් මාවත මගින් ද; ගිණිකොණට : මෙහි ලොට් 1D මගින් ද; නිරිතට : මෙහි ලොට් 1E සහ ලොට් 1B (අඩි 10 පළල පාර) මගින් ද සහ වයඹට : මෙහි ලොට් 1B (අඩි 10 පළල පාර) මගින් ද මායිම් වූ එකී අංක 637/1998 දරන පිඹුර ප්‍රකාරව පර්චස් අටයි දශම දෙකයි පහ (අ.0, රූ.0, පර්.8.25)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය මහර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව G 194/129 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත විස්තර කරන ලද මාර්ග අයිතිය සමග වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, තලවතුහේන්පිට දකුණ - 267 ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත සහ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලවතුහේන්පිට දකුණ ගමේ පිහිටි "ගල්දෙනියවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, කේ. ඒ. රූපසිංහ විසින් 1998.10.20 වැනි දින පිළියෙල කරන ලද අංක 637/1998 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1B වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්: ඊසානට : එක්සත් මාවත මගින් ද; ගිණිකොණට : මෙහි ලොට් 1C සහ 1E මගින් ද; නිරිතට : මෙහි ලොට් 1F මගින් ද සහ වයඹට : මෙහි ලොට් 1F සහ 1A මගින් ද මායිම් වූ එකී අංක 637/1998 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තුනයි දශම පහයි හය (අ.0, රූ.0, පර්.3.56) ක විශාලත්වයෙන් වූ ඉඩම වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වර්තමානයේ මහර වෙළුම/පත්‍රිරුව G 27/60 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්.ඒ.පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2026 මැයි මස 27 වැනි දින.

10 - 390

---

### සම්පත් බැංකුව පී.එල්.සී.
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින් වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලද යෝජනා සම්මුතිය

තුෂාර ට්‍රේඩිං කම්පැණි
ගිණුම් අංකය : 0034 1000 5254

සම්පත් බැංකුව පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.06.24 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. එන්. එම්. කෝදාගොඩ විසින් ලියා සහතික කරන ලද 2014 මාර්තු මස 18 දාතම හා අංක 1225 දරන, උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "තුෂාර ට්‍රේඩිං කම්පැණි" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන හවුල් ව්‍යාපාරයේ 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 7(2) යටතේ කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක DSP 00041/25 මගින් මියගිය නන්ද සූරියආරච්චිගේ නිසිලෙස පත්කොට ඇති නිත්‍යානුකූල නියෝජිත වශයෙන් වර්තමානයේ කටයුතු කරන තුෂාර සූරියආරච්චි මියගිය නන්ද සූරියආරච්චි බන්ධනදායි වශයෙන් හා තුෂාර සූරියආරච්චි උකස්කරු වශයෙන් ද පැහැරහැර ඇති හෙයින් ද;

එමෙන් ම සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එන්. එම්. නාගොඩවිතාන විසින් ලියා සහතික කරන ලද 2010 නොවැම්බර් මස 23 දාතම හා අංක 837

දරන, උකස් බැඳුම්කරය සී. ජී. අබේවික්‍රම විසින් ලියා සහතික කරන ලද 2021 අගෝස්තු මස 12 දාතම හා අංක 4418 දරන, හා 2022 සැප්තැම්බර් මස 07 දාතම හා අංක 4757 දරන උකස් බැඳුම්කර දෙක යන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "තුෂාර ට්‍රේඩිං කම්පැණි" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන හවුල් ව්‍යාපාරයේ 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 7(2) යටතේ කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක DSP 00041/25 මගින් නිසිලෙස පත්කොට ඇති මියගිය නන්ද සූරියආරච්චි ගේ නිත්‍යානුකූල නියෝජිත වශයෙන් වර්තමානයේ කටයුතු කරන තුෂාර සූරියආරච්චි මියගිය නන්ද සූරියආරච්චි බන්ධනදායි වශයෙන් හා 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 7(2) යටතේ කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු අංක DSP 00041/25 මගින් නිසිලෙස පත්කොට ඇති මියගිය නන්ද සූරියආරච්චි ගේ නිත්‍යානුකූල නියෝජිත වශයෙන් වර්තමානයේ කටයුතු කරන තුෂාර සූරියආරච්චි මියගිය නන්ද සූරියආරච්චි උකස්කරු වශයෙන් ද පැහැරහැර ඇති හෙයින් ද;

එකී අංක 1225, 837, 4418 සහ 4757 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් නව කෝටි හැට පන් ලක්ෂ විසි පන් දහස් පන්සිය හැත්තෑ පහක් සහ ශත හැත්තෑවක (රු. 96,525,575.70) මුදලක් 2026 ජුනි මස 02 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් නව කෝටි හැට පන් ලක්ෂ විසි පන් දහස් පන්සිය හැත්තෑ පහක් සහ ශත හැත්තෑවක (රු. 96,525,575.70) මුදල ද, 2026 ජුනි මස 03 දින සිට අංක 1225, 837, 4418 සහ 4757 උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හය කෝටි විසි හය ලක්ෂ තිස් පන් දහසක (රු. 62,635,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුව (15.50%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1225, 837, 4418 සහ 4757 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන එම්. එච්. ටී. කරුණාරත්න ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ගල්කිස්ස ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ අංක 537B, කොහුවල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කළුබෝවිල පිහිටි වර්තමානයේ වරිපනම් අංක 178/2 දරන "දෙල්ගහකනත්තේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. ආර්. සිල්වා විසින් සාදන ලද 2011 නොවැම්බර් මස 25 දාතම හා අංක 4567 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A1A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (අඩි 10 සිට 12 දක්වා පළල පාර); නැගෙනහිරට : අංක 1923 දරන පිඹුරේ ලොට් $A1^{B}$; දකුණට : මෙල්ඩ පෙදෙස, වරිපනම් අංක 2 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : හයිලෙවල් පාර, වරිපනම් අංක 178/4 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම එකයි බිංදුවක් (A:0, R:0, P:5.10) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ පිඹුරු අංක 4567 ට අනුව ය.

   එකී ලොට් A1A පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

   එකී කළුබෝවිල පිහිටි හයිලෙවල් පාර වර්තමානයේ වරිපනම් අංක 178 (කොටසක්) දරන "දෙල්ගහකනත්තේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඒ. කපුගීකියන විසින් සාදන ලද 1992 අප්‍රේල් මස 26 දාතම හා අංක 1923 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A1A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (අඩි 10 සිට 12 දක්වා පළල පාර); නැගෙනහිරට : අංක 1923 දරන පිඹුරේ ලොට් $A1^{B}$; දකුණට : මෙල්ඩ පෙදෙස, වරිපනම් අංක 2 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : හයිලෙවල් පාර, වරිපනම් අංක 178/4 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම එකයි බිංදුවක් (A:0, R:0, P:5.10) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ එකී පිඹුරු අංක 4567ට අනුව වෙළුම/පත්ඉරුව F 108/117 හි දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

   (උකස් බැඳුම්කර අංක 1225 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ දෙහිවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, අංක 537B, කොහුවල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වෝඩ් අංක 03, නුගේගොඩ ගංගොඩවිලෙන් හැරී ඒකනායක මාවත පිහිටි වරිපනම් අංක 21 දරන "ජම්බුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. කේ. පී. ඔකඳපොල විසින් සාදන ලද 2002 පෙබරවාරි මස 06 දාතම හා අංක 39/2002 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට

ලොට් 1[12B] වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : 1942 මැයි මස 19 දාතම හා අංක 3340 දරන පිඹුරෙහි ලොට් 2, ඒකනායක ඇවනිව්, වරිපනම් අංක 19 දරන පරිශ්‍රයන්; නැගෙනහිරට : 1942 මැයි මස 19 දාතම හා අංක 3340 දරන පිඹුරෙහි ලොට් 4, ශාන්ත ජෝශප් ඇවනිව්, වරිපනම් අංක 3 දරන පරිශ්‍රයන්; දකුණට: මෙහි ලොට් 1 2B සහ බස්නාහිරට : ඒකනායක ඇවනිව් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (A:0, R:0, P:18.0) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ පිඹුරු අංක 39/2002 ට අනුව වෙළුම/පත්ඉරුව F 363/59 හි දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 837, 4418 සහ 4757 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10 - 376

---

**ලංකා බැංකුව**

## 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.07.10 වැනි දින පවත්වන ලද රැස්වීමේදී විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී:

1. මාතර ප්‍රසිද්ධ නොතාරිස් බී. කේ. ආර්. කාරියවසම් විසින් සහතික කරන ලද 2017 ජුනි මස 19 දිනැති අංක 1200 දරන උකස් බැඳුම්කරය හා මාතර ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. ටී. එස්. ද සිල්වා විසින් සහතික කරන ලද 2021 සැප්තැම්බර් මස 21 දිනැති අංක 441 දරන උකස් බැඳුම්කරය අනුව ස්ථිර අයිරාව මත 2026.04.20 වැනි දිනය දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රු. 12,515,652.32ක (රුපියල් එක්කෝටි විසිපන් ලක්ෂ පහළොස්දහස් හයසිය පනස් දෙකයි ශත තිස්දෙකක) මුදලක් හා රු. 7,000,000.00ක (රුපියල් ලක්ෂ හැත්තෑවක) මුදල මත 2026.04.21 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය දක්වා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහ (15.50%) බැගින් වූ පොළී අනුපාතය යටතේ තවදුරටත් පොළිය ද, BOC SME විශේෂ III ණය මත 2026.04.20 වැනි දිනය දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රු. 4,919,848.06ක (රුපියල් හතළිස් නවලක්ෂ දහනවදහස් අටසිය හතළිස් අටයි ශත හයක) මුදලක් හා රු. 3,611,233.04ක (රුපියල් තිස් හයලක්ෂ එකොළොස් දහස් දෙසිය තිස්තුනයි ශත හතරක) මුදල මත 2026.04.21 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය දක්වා වාර්ෂිකව සියයට නවයයි දශම පහ (9.50%) බැගින් වූ පොළී අනුපාතය යටතේ තවදුරටත් පොළිය ද, වාරික ණය මත 2026.04.20 වැනි දිනය දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රු. 3,703,671.59ක (රුපියල් තිස් හත්ලක්ෂ තුන්දහස් හයසිය හැත්තෑ එකයි ශත පනස් නවයක) මුදලක් හා රු. 2,250,000.00ක (රුපියල් විසිදෙලක්ෂ පනස් දහසක) මුදල මත 2026.04.21 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය දක්වා වාර්ෂිකව සියයට දාහතරයි දශම පහ (14.50%) බැගින් වූ පොළී අනුපාතය යටතේ තවදුරටත් පොළිය ද, 29/2022 යටතේ 1 වන උප ණය මත 2026.04.20 වැනි දිනය දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රු. 544,667.72ක (රුපියල් පන්ලක්ෂ හතළිස් හතර දහස් හයසිය හැට හතයි ශත හැත්තෑ දෙකක) මුදලක් හා රු. 357,802.38ක (රුපියල් තුන්ලක්ෂ පනස් හත්දහස් අටසිය දෙකයි ශත තිස්අටක) මුදල මත 2026.04.21 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය දක්වා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහ (15.50%) බැගින් වූ පොළී අනුපාතය යටතේ තවදුරටත් පොළිය ද, 29/2022 යටතේ 2 වන උප ණය මත 2026.04.20 වැනි දිනය දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රු. 617,962.27ක (රුපියල් හයලක්ෂ දාහත්දහස් නවසිය හැටදෙකයි ශත විසිහතක) මුදලක් හා රු. 399,765.79ක (රුපියල් තුන්ලක්ෂ අනූනවදහස් හත්සිය හැටපහයි ශත හැත්තෑ නවයක) මුදල මත 2026.04.21 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය දක්වා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහ (15.50%) බැගින් වූ පොළී අනුපාතය යටතේ තවදුරටත් පොළිය ද, අහංගම, මීදිගම, දේනුවල හි වී. වී. ඩිස්ට්‍රිබියුටර්ස් ඔෆ් ඩොල්සි විටා සර්ෆ් රෙසෝට් හි තනි අයිතිකරු වන යද්දෙහි ආරච්චිගේ රාජපක්ෂ වජිර විදේහ මහතාගෙන් බැංකුවට අයවිය යුතුව ඇත.

2. 2017 ජුනි මස 19 දිනැති අංක 1200 දරන උකස් බැඳුම්කරය හා 2021 සැප්තැම්බර් මස 21 දිනැති අංක 441 දරන උකස් බැඳුම්කරය යටතේ ස්ථිර අයිරාව මත රු. 12,515,652.32ක (රුපියල් එක්කෝටි විසිපන් ලක්ෂ පහළොස්දහස් හයසිය පනස් දෙකයි ශත තිස් දෙකක) එකී මුදල ද, BOC SME විශේෂ III ණය මත රු. 4,919,848.06ක (රුපියල් හතළිස් නවලක්ෂ දහනවදහස් අටසිය හතළිස් අටයි ශත හයක) එකී මුදල ද, වාරික ණය මත රු. 3,703,671.59ක (රුපියල් තිස් හත්ලක්ෂ තුන්දහස් හයසිය හැත්තෑ එකයි ශත පනස් නවයක) එකී මුදල ද, 29/2022 යටතේ 1 වන උප ණය මත රු. 544,667.72ක (රුපියල් පන්ලක්ෂ හතළිස් හතර දහස් හයසිය හැට හතයි ශත හැත්තෑ දෙකක) එකී මුදල ද, 29/2022 යටතේ 2 වන උප ණය මත රු. 617,962.27ක (රුපියල් හයලක්ෂ දාහත්දහස් නවසිය හැටදෙකයි ශත විසිහතක) එකී මුදල ද 2026.04.21 වැනි දින සිට විකුණනු ලබන දිනය තෙක් ඉහත කී පරිදි තවදුරටත් පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අය විය යුතු ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව

වෙත උකස් කරනු ලැබ මෙහි පහත උපලේඛනයන් හි විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකරු වන මුදුගමුවේ හේවාවසම් තුසිත් කරුණාරත්න මහතාට ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය (397 වන අධිකාරය) සහ එහි සංශෝධන යටතේ ද, එකී ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළකිරීම සඳහා ලංකා බැංකුවේ මාතර නගර ශාඛාවේ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක කෝරළේ, පස්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 249B, මැකිලියතැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඌරුබොක්කේ පිහිටා ඇති "මනංකැටිය හේන *හෙවත්* මනංකැටියේවල හේන (ලොට් 64)" නමැති ඉඩමේ ඒකාබද්ධ කරන ලද ලොට් 1 - ලොට් 10 දක්වා වන ලොට් (බලයලත් මිනින්දෝරු පී. එම්. අබේගුණවර්ධන විසින් සාදන ලද 2007 ජුනි මස 14 දිනැති අංක 390 දරන පිඹුරේ නිරූපණය කර ඇති) හා එම ඉඩමේ ලොට් 16හි ලොට් 1හි ලොට් 1, 2, 3, 5, 6 (බලයලත් මිනින්දෝරු පී. එම්. අබේගුණවර්ධන විසින් සාදන ලද 2007 ජුනි මස 13 දිනැති අංක 388 දරන පිඹුරේ නිරූපණය කර ඇති) බලයලත් මිනින්දෝරු පී. එම්. අබේගුණවර්ධන විසින් සාදන ලද 2008 සැප්තැම්බර් මස 06 දිනැති අංක 467 දරන පිඹුරේ නිරූපණය කර ඇති ලොට් 1B ලෙස ලකුණු කර බෙදා වෙන් කළ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 1B, උතුරට : එම ඉඩමේම ලොට් 14 හා 15 ද; නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 1C හා 1D ද; දකුණට : අංක 320 දරන පිඹුරේ ලොට් 02 (පාර) ද; බස්නාහිරට: එම ඉඩමේම ලොට් 1A ද මායිම්ව අක්කර එකයි රූඩ් එකයි පර්චස් පහළොවයි දශම බිංදුවයි අටක (අ.1, රූ.1, පර්.15.08) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, වැවිලි, ගොඩනැගිලි හා සියලු දේ සමග වේ. මෙය කොටපොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 70/14 හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 320 දරන පිඹුරේ ලොට් 02 ලෙස නිරූපණය කර ඇති මාර්ග වෙන්කිරීම මතින්, යටින් සහ ඒ ඔස්සේ ගමන් කිරීමේ අයිතිය (Right of Way) සහ ඊට අදාළ අනෙකුත් සියලුම අනුබද්ධ අයිතිවාසිකම් ද සමග වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ඩබ්ලිව්. කේ. වැල්ලගේ මහත්මිය,
කළමනාකරු.

ලංකා බැංකුව,
මාතර නගර ශාඛාව.

10 - 400

### ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය.)

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.06.24 දින පැවැත්වීමට යෙදුනු 2026/06 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් අයුරින් විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

ණය අංක : 104089000019

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙනුවෙන් ගම්පහ නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. අයි. ජයමාලි රණවක මහත්මිය විසින් සහතික කරන ලද 2022.08.26 දින 101 දරන උකස් ඔප්පු ප්‍රකාර අයවිය යුතු මුදල් ගෙවීම ණයකරුවන් ලෙස හඳුන්වනු ලබන හොරණ, මූනගම, නර්තනගල පාර, ස්වර්ණපුර, නො. 22 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 841032063V දරන මධුසංක දේශාන් රණසිංහ සහ හැඳුනුම්පත් අංක 868532050V දරන නාකන්දලගේ දෝන කුමුදුනී දර්ශිකා යන අය විසින් අපගේ මිල්ලනිය ශාඛාවෙන් ලබාගත් රුපියල් මිලියන 7.5ක ණය මුදල නිසිලෙස ගෙවීම පැහැර හැර ඇත.

එබැවින් අංක 101 උකස්කරය යටතේ 2026.05.19 දිනට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට අයවිය යුතු රුපියල් 6,653,103.47 (රුපියල් හැටහය ලක්ෂ පනස් තුන්දහස් එකසිය තුනයි ශත හතළිස් හතක) ණය ශේෂය හා එදිනට අයවිය යුතු පොළිය රුපියල් 2,260,477.63 (රුපියල් විසිදෙලක්ෂ හැට දහස් හාරසිය හැත්තෑ හතයි ශත හැටතුනයි) ක් හා එදිනට අයවිය යුතු ගාස්තු රුපියල් 25,761.19 (රුපියල් විසිපන්දහස් හත්සිය හැටඑකයි ශත දහනවයයි) සමග අයවිය යුතු සම්පූර්ණ මුදල රුපියල් 8,939,342.29 (රුපියල් අසූනවලක්ෂ තිස්නව දහස් තුන්සිය හතළිස් දෙකයි ශත විසිනවයයි)ක් හා 2026.05.19 දින සිට වෙන්දේසි දින දක්වා 29% ප්‍රතිශතය යටතේ අයවිය යුතු පොළිය සහ වෙනත් අයකරනු ලැබිය යුතු මුදල් සහ වැට් බදු හා දැන්වීම් ගාස්තු ද ඇතුළු වෙන්දේසි වියදම් සමග තවදුරටත් නීත්‍යානුකූල වියදමක් බැංකුවට අයවීමට තිබේ නම් එම මුදල් ද අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී මුදල් අයකර ගැනීම සඳහා ණයකරුවන් විසින් අංක 101 දරන උකස්කරය මගින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇති එම උකස්කරයේ උපලේඛනයෙන් විස්තර කරන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු ය. එම දේපළවල විස්තර පහත දැක්වේ.

තව ද, එකී උපලේඛනය මගින් විස්තර කොට ඇති දේපළ වෙන්දේසි කිරීමේ බලය අංගොඩ, අග්ගෝන, කලපළුවාව පාර, ධර්මපාල මාවත, අංක 501/10 හි බලයලත් වෙන්දේසිකරු කේ. පී. එන්. සිල්වා මහතා වෙත පවරා ඇත.

**උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

ප්‍රසිද්ධ නොතාරිස් සාධනි දිසානායක විසින් 2014.08.07 දින ලියා සහතික කළ අංක 40 දරන සින්නක්කර ඔප්පුව මත මෙහි පළමු බන්ධනදායිට අයිතිව නිරවුල්ව භුක්ති විඳගෙන එන,

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, කුඹුකේ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා බල සීමාවට අයත් හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 616සී නර්තනගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, මූනගම යන ගමේ පිහිටි "අළුබෝගහවත්ත කැලේ *නොහොත්* අළුබෝගහවත්තේ කැලේ" නැමැති ඉඩමට කේ. දමයන්ති ජාලිකා රණසිංහ බලයලත් මානක තැන විසින් 2020.08.31 දින මැන සාදන ලද 002 දරන පිඹුරෙහි දැක්වෙන කැබලි අංක 1 නමැති කොටසට මායිම් :

*උතුරට* : 3833 දරන පිඹුරෙහි අංක 55, 21 ද;
*නැගෙනහිරට* : පාර ද;
*දකුණට* : 3833 දරන පිඹුරෙහි අංක 25 ද;
*බටහිරට* : 3833 දරන පිඹුරෙහි අංක 24, 55 ද;

යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතරයි දශම දෙකයි (අක්.0, රූඩ්.0, පර්.14.2) *හෙවත්* හෙක්ටයාර් 0.0360ක් විශාල බිම හා එයට අයත් ගොඩනැගිලි, ගහකොළ ඇතුළු සියල්ල වේ.

ඉහත විස්තර කර ඇති කැබලි අංක 1 පහත ඉඩමෙහි නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, කුඹුකේ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා බල සීමාවට අයත් හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 616 සී, නර්තනගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, මූනගම යන ගමේ පිහිටි "අළුබෝගහවත්ත කැලේ *නොහොත්* අළුබෝගහවත්තේ කැලේ" නැමැති ඉඩමට ඩී. එච්. ඇතුලත්මුදලි බලයලත් මානක තැන විසින් 2003.03.01 දින මැන සාදන ලද 3833 දරන පිඹුරෙහි දැක්වෙන කැබළි අංක 22 නැමැති කොටසට මායිම් :

*උතුරට* : අංක 55, 21 ද;
*නැගෙනහිරට* : පාර ද;
*දකුණට* : අංක 25 ද;
*බටහිරට* : අංක 24, 55 ද;

යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතරයි දශම දෙකයි (අක්.0, රූඩ්.0, පර්.14.2) විශාල බිම හා එයට අයත් ගොඩනැගිලි, ගහකොළ ඇතුළු සියල්ල වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව.

ප්‍රධාන කාර්යාලය, අංක 933, නුවර පාර,
වෙදමුල්ල, කැළණිය.

10 - 371

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2026 වර්ෂය** | | | |
| **ඔක්තෝබර්** | 2026.10.02 | සිකුරාදා | 2026.09.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.10.09 | සිකුරාදා | 2026.09.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.10.16 | සිකුරාදා | 2026.10.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.10.23 | සිකුරාදා | 2026.10.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.10.30 | සිකුරාදා | 2026.10.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2026.11.06 | සිකුරාදා | 2026.10.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.11.13 | සිකුරාදා | 2026.10.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.11.20 | සිකුරාදා | 2026.11.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.11.27 | සිකුරාදා | 2026.11.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2026.12.04 | සිකුරාදා | 2026.11.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.12.11 | සිකුරාදා | 2026.11.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.12.18 | සිකුරාදා | 2026.12.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.12.24 | බ්‍රහස්පතින්දා | 2026.12.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.